# මානසික රෝග, සියදිවි නසා ගැනීම හා ජනමාධ්‍ය

අසිත මල්ලවආරච්චි

### හැඳින්වීම

හොද පෞර්ෂයකින් හෙබි පුද්ගලයා පහසුවෙන් සෑම දෙයකම යථාර්තය අවබෝධ කර ගනී. එවැනි පුද්ගලයාට යම් යම් සිදුවීම්වලට හා තත්වයන්ට පහසුවෙන් හා සාර්ථකව මුහුණ දිය හැකිවන අතර ගැටුම් ඇති කරගනු නොලැබේ. එසේම යථාර්තවාදි පුද්ගලයා තමාගේ කටයුතු පිළිබඳව අධි තක්සේරුවකින් පසු නොවේ. නමුත් පුද්ගලයා යථාර්තවාදි නොවන විට නොයෙක් මායාත්මක විශ්වාස මත කටයුතු කරමින් සිය ක්‍රියාකාරකම් අසාර්ථක වූ විට පුද්ගලයා චිත්තවේගි තත්වයට පත් වේ. මෙහිදි යථාර්තයෙන් ඈත් වූ පුද්ගලයාගේ සාවද්‍ය ආකල්ප, මායාත්මක විශ්වාස තර්කානුකූල ලෙස බිඳහෙලා දැමිය යුතුය.

අප සමාජයේ විවිධ පුද්ගලයින් තුළ පවත්නා මානසික ගැටලු සඳහා බොහෝ හේතුකාරක මුල් විය හැකිය. මේ අතර ජනමාධ්‍ය භාවිතය ද කාරක වන අවස්ථා පවතී. උක්ත කාරකය බලපාන්නට හේතු වී ඇත්තේ ජනමාධ්‍ය තුළින් ඉදිරිපත් වන දෑ අනවශ්‍ය ලෙස තමන් වෙත උකහා ගැනීමට යාම නිසා ය. සමහර විටෙක ජනමාධ්‍යයෙන් දක්වන චරිත අනුකරණය කිරීමටදරන්නා වූ උත්සාහයන් දැකිය හැකි ය. එහි දී ඇඳුම් විලාසිතාව, හිසකෙස් විලාසිතාව, කතා බහ කරන හා ඇවිදින විලාසිතාව ග්‍රහණය කර ගනී. මෙම උත්සාහයන් අන්තයට ගිය විට සිදුවන්නේ මානසික රෝගියෙකු බිහි වීමයි. බොහෝ විට අප අවට ලෝකය මවා පානු ලබන රූපවාහිනිය, අන්තර්ජාලය, චිත්‍රපට යන රූපය හා හඬ ප්‍රබලව භාවිත වන මාධ්‍ය හරහා මෙය වැඩි වශයෙන් සිදූ වේ. මේ අනුව මාධ්‍ය භාවිතයෙන් ලිංගික උත්තේජනය, ප්‍රචණ්ඩත්වය හා මානසික අවපීඩනයන් උග්‍ර තත්වයට පත් වීමෙන් සිය දිවි නසා ගැනීම් මතු වීමට ඉඩ ඇත.

### මානසික රෝග යනු

විවිධ රෝග කාරක හේතුවෙන් මිනිසුන් කායික රෝගවලට ගොදුරුවීම පිළිබඳව අප අත්දැකිමෙන් දනිමු. එමෙන්ම විවිධ හේතු කාරක නිසා මිනිස් මනස ද රෝගවලට ගොදුරු වන්නේය. බැක්ටීරියා, වෛරස් වැනි විෂබීජවලින්ද හදිසි අනතුරුවලින් වන තුවාලද, ශරීරයේ රසායනිකයන්ගේ වෙනස්වීම් ද මිනිසා රෝගි වීමට හේතුවන අතර නිතර නිතර සිදූවන සිත් වේදනා හා බලාපොරොත්තු කඩවීම් වේදනා සහගත අත්දැකිම්, තර්ජන ගර්ජන ආදිය මිනිස් මනස රෝගීවීමට හේතු වේ දැනට හඳුනාගෙන ඇති මානසික ආබාධ ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි.

- **නියුරෝසීය ආබාධ**
- **සයිකෝසීය ආබාධ**

- **නියුරෝසීය ආබාධ(Neurosis)**

මිනිසාට ඇති වන මානසික ආබාධවලින් 80% පමණ නියුරෝසිය ආබාධ වේ. මිනිස් මනස තුළ ඇති වන මානසික ගැටුම් සහ මිනිසුන් අතර පවතින අන්තර් පුද්ගල සම්බන්ධතාවන්ගේ ගැටලු නිසා මිනිසුන් මෙබඳු ආකාරයේ මානසික රෝගවලට ගොදුරු වන බව වෛද්‍ය මතය වේ. අධිකාංසාව, ඉච්ඡාභංගත්වය නියුරෝසිය ආබාධයන්ගේ ප්‍රධාන ලක්ෂණ දෙක වේ. මිනිසුන් තුළ පවතින ආශාවන් ඉටුකර ගැනීමට නොහැකි වූ අවස්ථාවල මෙම රෝගී තත්වය ඇති වීමට හේතු වේ. සිග්මන් ෆ්‍රොයිඩ්ට අනුව පුද්ගලයෙකුගේ උපතේ සිට වසර හයක් පමණ කාලයක් දක්වා හටගන්නා ඉච්ඡාභංග තත්වය පුද්ගල ජීවිතයට දැඩි බලපෑමක් කරනු ලබයි. රටක ජනගහනයෙන් 5% 10% ත් අතර ප්‍රමාණයක් නියුරෝසිය රෝගී තත්වයන්ගෙන් පෙළෙයි. ඇතැම් විට මෙම ප්‍රතිශත වෙනස් විය හැක. මිනිසුන් තුළ පවතින භීතිකාවන්, සමහර අත්හැර දැමිය නොහැකි පුරුදු, මිදිය නොහැකි චර්යාවන් ආදිය නියුරෝසිය තත්වයේ රෝගී තත්වයන් විය හැක. මෙම රෝගී තත්වයන් ප්‍රධාන කොටස් කිහිපයකට වෙන් කළ හැකිය.

i. හිස්ටීරියාව
ii. කාංසාව
iii. භීතිකාව

### i. හිස්ටීරියාව(Hysteria)

හිස්ටීරියාවේ ප්‍රධාන රෝග ලක්ෂණය නම් කායික හෝ මානසික ක්‍රියාකාරීභාවය නැති වී යාමය. අනෙකුත් රෝග ලක්ෂණයන් වන්නේ "කථා කිරීමේ අපහසුව, ශබ්දය පිට නොවීම, ශරීර ගැස්ම, ඇතැම් ශාරීරික අංගවල ඇතිවන අප්‍රාණිකබව, අන්ධබව, බිහිරි බව, ගිලීමේ අපහසුව, ඔක්කාරය, වෙවුලීම, අවනත වීම, බොරුකීම" (පෙරේරා,2007,22 පිටුව) ආදිය හඳුනාගත හැකිය.

### ii. කාංසාව(Anxiety)

පුද්ගලයෙකු නිදහස් වීමට කැමති පීඩාවකින් පීඩා විඳීම කාංසාව නමින් හැඳින්වේ. කාංසාව යන්න රෝගයකට වඩා පුද්ගලයාට කරනු ලබන අනතුරු සංඥාවක් බව සිග්මන් ෆ්‍රොයිඩ් පවසයි. මෙම තත්වය සමහර අවස්ථාවල දීර්ඝ කාලීනව පුද්ගල ජීවිතය තුළ දැකිය හැකිය. අනාරක්ෂිත හැඟීම, නින්ද නොයාම, උදරාබාධ, කලබලකාරී බව, සැක සහිත බව, බිය වීම, දහඩිය දැමීම, අල්ල තෙමීම, හුස්ම ගැනීමේ අපහසුතා (පෙරේරා,2007,20 පිටුව) යනාදිය මෙහි ප්‍රධාන රෝග ලක්ෂණ වේ. මනෝ ශිල්ප ක්‍රම භාවිතයෙන් මෙම රෝග සුව කළහැක.

### iii. භීතිකාව(Phobia)

යම් කිසි ස්ථානයකට, දෙයකට, වස්තුවකට, සතෙකුට හෝ වෙනත් ඕනෑම දෙයකට දක්වන්නා වූ අහේතුක බිය මේනමින් හඳුන්වයි. සිතුවිලි පාලනය කිරීමේ යන නාමින් ද මෙය හඳුන්වයි. සාමාන්‍ය වශයෙන් මිනිසුන් බිය නොවිය යුතු දෙයට දක්වන භීතිකාවයි. මිනිසුන් තුළ මෙවැනි භීතිකා රාශියකි.

- සමාජ භීතිකාව
- තත්ව භීතිකාව

- අඳුරු භීතිකාව
- සෙනඟට දක්වන බිය
- උස් ස්ථානවලට දක්වන බිය ආදිය උදාහරණ වේ.

**සයිකෝසීය ආබාධ(psychosis)**

බරපතල ආකාරයේ මානසික ආබාධ සයිකෝසීය ආබාධ නමින් හැඳින්වේ. සයිකෝසීය රෝග ප්‍රබල ලෙසින් පුද්ගල පෞර්ෂය කෙරෙහි බලපෑම් කරනු ලබන අතර ඒ මඟින් පුද්ගල මානසික ස්භාවය සහ චිත්තවේග ව්‍යාකූල කර දමනු ලැබේ. මෙවිට පුද්ගලයා තුළින් ස්වකීය පාලනය ගිලිහී යන අතර ම සමාජයට ගැළපෙන ලෙස හැඩගැසීම දුෂ්කර වේ. විවිධාකාරයේ සයිකෝසීය රෝග පවතින අතර ඒ එක් එක් රෝග සඳහා වූ රෝග ලක්ෂණ තිබෙන මුත් බොහෝ විට පොදු ලක්ෂණ කිහිපයක් පවතී. සයිකෝසීය රෝගීන් 99% ක් පමණ අසාමාන්‍ය චර්යාවන් දක්වනු ලබන අතර අමුතුම ආකාරයේ අරුම පුදුම චර්යාවන් ද ඒ අතර වේ. මේ චර්යාවන් බොහෝ විට අන් අයට හිංසාකාරී වේ.

රෝහල් ගත කරන ලද රෝගීන් 3/4 පමණ සියදිවි නසා ගැනීමේ ප්‍රවණතාවක් පෙන්වයි. ඒ අතර 1/5 ක් පමණ අන් අයගේ ජීවිතවලට තර්ජනයක් වේ. සයිකෝසීය ආබාධ තත්වයන් කාණ්ඩ කිහිපයකට වර්ග කළ හැකිය.

i. හින්නෝන්මාදය

ii. උන්මාද විශාදය (පෙරේරා,2007,44 පිටුව)

**i. හින්නෝන්මාදය(Schizophrenia)**

මිනිසාට වැළඳෙන මානසික රෝග අතරින් මෙය ඉතා බරපතල රෝගී තත්වයකි. හින්නෝන්මාදය "බිඳුණු සිත" (Splitmind) වශයෙන්ද හඳුන්වනු ලබයි. (පෙරේරා,2007,44 පිටුව) ලෝක ජනගහනයෙන් 1% කට පමණ හින්නෝන්මාදය වැළඳී ඇති බවට සොයාගෙන ඇත. එහි රෝග ලක්ෂණ අතර ආකල්ප උද්දීපනය, චිත්තවේග හා අන්තර් පුද්ගල සම්බන්ධතා බිඳ වැටීම ප්‍රධාන වේ. හින්නෝන්මාදය වැඩිහිටි විය ආරම්භක අවධියේ දී සහ තරුණ වියේ දී බහුලව දැකගත හැකි අතර මෙම රෝගීන්ගෙන් 65% ක් පමණ අවුරුදු 2040 ත් අතර පසුවන අයයි. තවද, පුද්ගල චින්තන ක්‍රියාවලියේ ගැටලුකාරී තත්වයන් ඇති වීම, සිතුවිලි අවුල් වීම, අසත්‍ය විශ්වාසයන්හි එල්බ ගැනීම, සිතුවිලි වෙනස් වීම ආදිය මෙවන් රෝගීන් අතර දැකිය හැකි ලක්ෂණ කිහිපයකි. බොහෝ විට මෙම රෝගීන් අන් පුද්ගලයන් සහ තමන් අවට පවතින සියලුම දේවල් පිළිබඳව සැක කිරීමට පටන් ගනියි. අහේතුක සැකය හින්නෝන්මාදයේ ප්‍රධාන රෝග ලක්ෂණය වන අතර එම සැකයේ ප්‍රමාණය අනුව රෝගයේ ස්වභාවය තීරණය වේ.

**ii. උන්මාද විශාදය (Manic Depressive)**

සතුට සහ කලකිරීම යන අන්ත දෙක අතර පුද්ගල චිත්තවේග අසාමාන්‍ය ලෙසින් වෙනස් වීම උන්මාද විශාද සයිකෝසියාව නම් වන අතර මෙය මිනිසුන්ගේ චිත්තවේගයන් වෙනස් වීම නිසා හටගන්නා මානසික ආබාධයකි. උද්යෝගය හා උනන්දුව හීන වී ගොස් තමන් පිළිබඳව කලකිරීමකට පත් වීමත්, තමන් බරක්

යැයි සිතීමත්, ජීවත් වී පලක් නැතැයි සිතීමත්, ඒ නිසාම අවසානයේ දී සියදිවි නසා ගැනීමත් ඔවුන් අතර බහුලව දැකිය හැකිය. ඊට අමතරව අසාමාන්‍ය නින්ද, මහ ඊ අවදි වීම, නින්ද නොයාම, ශාරීරික ශක්තිය අඩු වීම ආදි රෝග ලක්ෂණ දැකිය හැකිය. මෙම තත්වය උග්‍ර තත්වයට පත් වූ විට සම්පූර්ණයෙන්ම සුව කළ නොහැක. සුව කරන ලද රෝගීන් අතර වුවද වෙනස් කළ නොහැකි ලෙස දිගටම පවතින්නා වූ රෝග ලක්ෂණ දැකිය හැකිය.

**සියදිවි නසා ගැනීම**

සියදිවි නසා ගැනීම (Suicide, Suicidium, Sui caedere) තමන්ගේ ජීවිතය හිතාමතාම තමන් විසින්ම නැති කර ගැනීමේ ක්‍රියාවලිය සියදිවි නසා ගැනීම ලෙස නිර්වචනය කළ හැකිය. සිය දිවි නසා ගැනීමට තැත් කිරීම හෝ මාරක නොවන ආකාරයේ සියදිවි නසා ගැනීම් හැසිරීම් මගින් තම ජීවිතය මරණයෙන් අවසන් නොවුනද සදාකාලික අබාධ තත්වයට ගොදුරු විය හැකිය. (http://si.wikipedia.org/wiki/Suicide) මෙම ක්‍රියාව "ස්වයං නාශක ක්‍රියාව" (මලලසේකර ශබ්දකොශය, 2002, 1004 පිටුව) ලෙසද හැදින්විය හැකිය. සිය දිවි නසා ගැනීමට අනුබල දීම (Assisted suicide) යනු යමෙක් තව කෙනෙකුට තම ජීවිතය නැති කර ගැනීම වක්‍රාකාරයෙන් උපදෙස්, අවවාද හෝ උපක්‍රම ලබාදීමයි. නමුත් අනායාස මරණයේදි හෙවත් දුක් නොවිද මරණයේදි (Euthanasia) මීට පරස්පර තත්වයක් උද්ගත වේ. එනම් පුද්ගලයෙකු තවත් පුද්ගලයෙකුට අනායාස මරණයක් ළඟාකර දීම සඳහා ක්‍රියාකාරිව දායක වේ. ඇතැම් රටවල මෙම ක්‍රමය නීතිගත කර ඇත. (http://si.wikipedia.org/wiki/Suicide).

තාර්කනික සිය දිවි නසා ගැනීම (Rational suicide) යනු තම ජීවිත නැති කර ගැනීම තාර්කික නොවේයැයි සිතුවත් එය සාධාරණය කිරීමට හේතු කාරණා ඉදිරිපත් වීමයි. අනුන්ගේ යහපත වෙනුවෙන් තමන්ගේ ජිවිතය නැති කර ගැනීම පරහිතකාරී සියදිවි නසාගැනිම (altruistic suicide) ලෙස හදුන්වනු ලැබේ. (Hales, edited by Robert I. Simon, Robert E.. The American Psychiatric Publishing textbook of suicide assessment and management (2nd ed .( Washington, DC: American Psychiatric Pub.. p. 714.) සියදිවි නසා ගැනීමේ ආක්‍රමණයක් (Suicide attack) යනු දේශපාලන ක්‍රියාවලියක් වන අතර එහිදි ආක්‍රමණිකයා අනුන් කෙරෙහි ප්‍රචණ්ඩත්වය මුදා හරින අතර අවසානයේ ඔහුගේ ජිවිතය ද නැති වී යයි. මිනීමරු සියදිවි නසා ගැනීම (murder-suicide) යනු මිනීමරුවා තම ජිවිතය එම අපරාධය කිරීමෙන් පසුව නැති කර ගැනීමයි. (Eliason, S (2009). "Murder-suicide: a review of the recent literature.". The journal of the American Academy of Psychiatry and the Law **37** (3): 371–6.) බහුජන දිවි නසා ගැනීම (suicide pact) යනු එල්ලවන සමාජීය පීඩනය හමුවේ තම ස්වාධීපත්‍ය යම් නායකයෙකුට ලබා දීම සඳහා සිය දිවි නසා ගැනීමයි. මිනිසුන් දෙදෙනෙක් එක්ව වුවද බහුජන දිවි නසා ගැනීමක් කළ හැකිය. (Smith,

William Kornblum in collaboration with Carolyn D.Sociology in a changing world (9e [9th ed] .Belmont, CA: Wadsworth Cengage Learning. p. 27.).

ලෝක ජනගහනයෙන් 0.5%ක සිට 1.4%ක් දක්වා මිනිසුන් ප්‍රමාණයක් දිවිනසා ගන්නා බව පර්යේෂණ මඟින් සොයාගෙන ඇත. 2008, 2009 වර්ෂවල මිනිසුන් මරණයට පත්වීමේ මාර්ග අතුරින් 10 වැනි ස්ථානයට පත්ව ඇත්තේ සියදිවි නසා ගැනීමයි. සිය දිවි නසා ගැනීමේ වාර්ෂික අනුපාතිකය 11.6%ක් වේ (Värnik, P (2012 Mar). "Suicide in the world.". International journal of environmental research and public health **9** (3): 760–71.) සිය දිවි නසා ගැනීමේ ප්‍රතිශතය 1960 සිට 2012 වර්ෂය වන විට 60% කින් වර්ධනය වී ඇත. (WHO Sites: Mental Health. World Health Organization. Aug 31,2012) මිනිසුන් සියදිවි නසා ගැනීමේ ක්‍රමවේද ගණනාවක් තිබේ. එම ක්‍රමවේදවලින් ප්‍රධාන ආකාර ලෙස හඳුනාගත හැක්කේ ගෙල වැළලාගෙන මැරීම, පළිබෝධනාසක පානය කිරීම, ගිනි අවි භාවිතයෙන් තම ජීවිතය නැති කර ගැනිම මෙන්ම ගිනිතබා ගැනීම ආදිය බහුල වශයෙන් දකිය හැකිය. අතීතයේ යුරෝපානු රටවල සිය දිවි නසා ගැනීම හෝ සිය දිවි නසා ගැනීම තැත් කිරීම දඬුවම් ලැබිය හැකි අපරාධයක් ලෙස සැලකුවද වර්තමානයේ බොහෝ යුරෝපානු රටවල එම තත්වය වෙනස් වී ඇත. ඖෂධ භාවිත කිරිම තුළින්ද සියදිවි නසා ගන්නා අවස්ථා පවති. ජපානයේ තමා විසින්ම තම බඩවැල් කපා තනිමින් සියදිවි නසා ගැනීමේ ක්‍රමයක් පවති. එනමුදු බොහෝ ඉස්ලාමීය රටවල සියදිවි නසා ගැනිම දඬුවම් ලැබිය හැකි අපරාධයකි. 20, 21 වන සියවස්වල විරෝධතාවය පළ කිරීමේ ක්‍රමවේදයක් ලෙස තම ජීවිතය නැති කර ගැනීම සිදු කර ගනු ලැබේ. එමෙන්ම යුද්ධ ගැටුම්වලදී ත්‍රස්තවාදි උපක්‍රමයක් ලෙස මරාගෙන මැරෙන බෝම්බ පුපුරවාගෙන මැරිම හා සයනයිඩ් කෑම වැනි ක්‍රමවේදයන්ද දකිය හැකිය. "බොහොමයක් මෙම සිය දිවි නසා ගැනීම් කලින් සැලසුම් කරන ඒවා නොවන අතර බොහොවිට සිදු වන්නේ තමන් කෙරෙහි දැඩි ලෙස සැක උපදවන අවස්ථාවලදිය. මරණ ප්‍රමාණය විධික්‍රමය මත විවිධ වේ. ගිනි අවි භාවිතය 80%-90%, ගිලි මැරීම 65%-80%, එල්ලී මැරීම 60%-85%, විෂ දුම ආග්‍රහණය40%-60% , යමකට පැනීමෙන් 35%-60%, ගල් අඟුරුවලට පුලුස්සා ගැනීමෙන් 40%-50%, පළිබෝධනාශක60%-75%, ඖෂධ අනිසි ලෙස භාවිතය 1.5-4% වශයෙන් දක්විය හැකිය.

"අතීත ග්‍රීක ඇතැන්ස් වැසියන් විසින් රජයේ අනුමැතියකින් තොරව සියදිවි නසාගන්නා පුද්ගලයන්ට අවසන් ගෞරව නොදක්වූ අතර ඔවුන්ට උසස් භූමිදානයක් හිමි නොවේ. එසේ මැරුණු පුද්ගලයන් ළඟපාත නගරයක මිහිදන් කරන අතර සිහිවටන එලක, සොහොන් වැනිදේ ඔවුන්ට නිර්මාණය නොකරන ලදී". (Szasz, Thomas (1999). Fatal freedom: the ethics and politics of suicide. Westport, Conn.: Praeger. p. 11). "In Ancient Greece and Rome suicide was deemed to be an acceptable method to deal with military defeat" (Maris, Ronald (2000). Comprehensive textbook of

suicidology. New York [u.a.]: Guilford Press. pp. 97–103) අතීතයේ ග්‍රීසිය හා රෝමය යුද්ධ පරාජ හමුවෙ සියදිවි නසා ගැනීම පිළිගත් දෙයක් විය. අතීත රොමයේ මේ සඳහා ඉඩ ලැබුණද පසුව ආර්ථික වියදම නිසා මෙය අපරාධයක් බවට පත් කරන ලදි (Dickinson, Michael R. Leming, George E.. Understanding dying, death, and bereavement (7th ed. .(Belmont, CA: Wadsworth Cengage Learning. p. 290.) 1670 දි 14 වන ලුවිස් රජතුමා නිකුත් කරන ලද අපරාධ ආඥා පනත මඟින් සියදිවි නසා ගැනීමට දඬුවම් වැඩිකරන ලදි. මෙහිදි මැරුණු පුද්ගලයන් සිරුර වීදිවලට ගෙන ගෙනවිත් මුහුණ යටට සිටින සේ පාර දිගේ ඇදගෙන යාම හා සිරුර එල්ලා කුණු, මඩ වැනි දේවලින් ගැසීම සිදු කරන ලදි. (Durkheim's Suicide : a century of research and debate (1. publ .(.London [u.a.]: Routledge. 2000. p. 69.) ඉතිහාසයේ ක්‍රිස්තියානි පල්ලිවල අයගෙන් සියදිවි නසාගැනීමට තැත්කළ අය ආගම් සභාවේන් ඉවත් කරන ලද අතර ඔවුන්ගේ සිරුරු පාරිශුද්ධත්වයට පත්කර සොහොන්බිම්වලට එළියෙන් මිහිදන් කරන ලදි. (Maris, Ronald (2000). Comprehensive textbook of suicidology. New York [u.a.]: Guilford Press. p. 540) 19 වන සියවසේ දි එක්සත් රාජධානියේදි සියදිවි නසා ගැනීමට වෙර දැරිම හා මිනිස් ඝාතනයට තැත් කිරිම සමාන වරදවල් ලෙස සැලකූ අතර එල්ලා මැරීම දඬුවම ලෙස ලබාදෙන ලදි. පසුව 19 වනසියවසේදි යුරොපීය නීතිය මෙය පාපයක් නිසා සිදුවන්නක් හෝ සිහිවිකල් බව නිසා සිදුවන්නක් ලෙස සලකා ලිහිල් කරන ලදි. (Maris, Ronald (2000). Comprehensive textbook of suicidology. New York [u.a.]: Guilford Press. p. 540).

**සියදිවි නසා ගැනීම මානසික රෝගයක්ද?**

යම් පුද්ගලයෙක් සිය දිවි නසා ගැනීමෙ අවස්ථාවේදි ඔහුට මානසික රෝගාබාධයක් තිබීමේ ප්‍රතිශතය 27% සිට 90% දක්වා විය හැකි බව ඇස්තමේන්තුගත කර ඇත. 13 මානසික රෝගී වාට්ටුවකට ඇතුළත් කර ගන්නා රෝගීන්ගෙන් 8.6%කට තම ජිවිත කාලය තුළ සිය දිවි නසා ගැනීමේ අවදාමක් පවති. සිය දිවි නසාගන්නා මිනිසුන්ගෙන් අර්ධයකටම ප්‍රධාන වශයෙන් විෂාදය (major depressive disorder) නම් රෝගයෙන් පෙළෙන අතර තවත් සමහරක් bipolar disorderහාmood disorders වැනිරෝගවලින් පෙළෙනු ලැබේ. අනිත් සම්බන්ධිත තත්වයන් වන්නේ භින්නොන්මාදය (schizophrenia) (14%) පුද්ගල පෞර්ෂත්ව ගැටලු (personality disorders) (14%), bipolar disorder, සහ post traumatic stress disorder, bipolar disorder, සහ posttraumatic stress disorder යන තත්වයන්ය. භින්නෝන්මාදය සහිත පුද්ගලයන්ගෙන් 5%ක් සියදිවි නසා ගනි. මානසික රෝගයන් හි ප්‍රබල අවස්ථාවක් ලෙස සිය දිවි නසා ගැනීම් දැක්විය හැකිය. සියතින් තම මරණය සිදු කර ගන්නා සෑම අවස්ථාවක්ම සිය දිවි නසා ගැනීමක් නොවේ. තමා ගේ අත් වැරදීම් මත සිදුවන මරණය ද සිය දිවි නසා ගැනීමක් නොවේ. සියදිවි නසා ගැනීම යන්නෙන් අර්ථවත් වන්නේ තම

දැනුවත්භාවය ඇතිව තම මරණය සිදු කර ගැනීම යි. සිය මරණය අපේක්ෂාවෙන්ම චුවමනාවෙන් යුතුව ආරම්භ කරන ලද මරණයෙන් අවසන් වන ක්‍රියාවලිය සියදිවි නසා ගැනීම ලෙස විස්තරාත්මකව හඳුනාගත හැකි ය.

සිය දිවි නසා ගැනීම පිළිබඳව සලකා බැලීමේ දී ඇඩොල්ෆ් හිට්ලර්, අර්නස්ට් හෙමිංවේ, නීරෝ වැන්නන් පවා සිය දිවි හානි කරගෙන ඇත. මෙලෙස සිය දිවි නසා ගැනීමට පුද්ගලයන් විසින් විවිධ ක්‍රම භාවිත කර ඇත. මරණය අපේක්ෂා කරන්නා ගේ පෞරුෂය අනුව සිය දිවි නසා ගැනීම සඳහා භාවිත කරන උපක්‍රමයන් වෙනස් වේ. පුද්ගලයෙකුට සිය දිවි නසා ගැනීම සඳහා විවිධ හේතු සාධක තිබිය හැකි ය. පරම්පරාගතව එන රෝග, මානසික රෝග, මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය, බිඳ වැටුණු පුද්ගල මානසිකත්වය, බලාපොරොත්තු කඩ වීම්, විෂාදය, ඊට හේතු කාරක වන මූලික කාරණයන් ය. සමහර පුද්ගලයන් තමන් සිටින පීඩන තත්වයෙන් මිදීමට ද තවත් සමහර පුද්ගලයන් අනුන් වෙනුවෙන් ද සිය දිවි හානි කර ගනී. සියදිවි නසා ගැනීම සඳහා වන උක්ත සඳහන් හේතු ධාරාවන් දෙකක් ඔස්සේ සාකච්ඡා කළ හැකි ය.

I. සමාජීය සාධක

II. සෞඛ්‍යමය සාධක

සමාජීය සාධක යටතේ සමාජය තුළ හුදෙකලා වීම, අන්තර් පුද්ගල සබඳතා බිඳ වැටීම, එසේම ජනමාධ්‍ය මඟින් සිදු වන බලපෑම දැක්විය හැකිය. ජනමාධ්‍ය මඟින් බොහෝ අවස්ථාවන්හිදී සිය දිවි නසා ගැනීම් සඳහා අනුබල දෙන අවස්ථා ද දැකිය හැකි ය. ජන මාධ්‍ය මඟින් සිය දිවි නසා ගැනීම් වැනි අවස්ථාවන් වැඩි වශයෙන් දැක්වීමෙන් සුලු මානසික පීඩනයක දී වුව ද සිය දිවි හානි කර ගැනීමට පෙළඹීමට ඉඩ ඇත.

සියදිවි නසා ගැනීමේ මානසික රෝග අතුරින් විසාදය ප්‍රධාන තැනක් ගනී. විශේෂයෙන්ම ඉහත දක්වන ලද නියුරෝසික විශාද ප්‍රතික්‍රියා ලක්ෂණවලට වඩා සයිකෝසික රෝගීන්හට ජීවිතය එපා වුවද දිවි නසා ගන්නාබව තීරණය කළද දිවි නසා ගන්නේ නැත. ඇතැම් උන්මාද විශාද සයිකෝසික (Manic Depressive Psychosis) රෝගීන්හට අන්‍යයන්ගේ අනුකම්පාව දිනා ගැනීම, තමා දෙසට අවධානය ලබාගැනීම සඳහාත් චර්යාත්මක විලාසිතාවක් ලෙස තෝරාගනු ලබන්නේ සිය දිවි නසා ගැනීමට තැත් කිරීමයි (පෙරේරා, 2002, 41 පිටුව).

විශේෂයෙන්ම සයිකෝසික විශාද රෝගීන් තුළ මායා (Delusious) හා භ්‍රාන්ති (Hallucinations) දැකීම සිදු විය හැකිය. එසේම මිත්‍යා විශ්වාස මත ඔවුන් ක්‍රියාකරනු ලැබේ. තමා නිර්දෝෂී නොවන පුද්ගලයෙකු ලෙස සිතීමත් තමා නුසුදුස්සෙකු වශයෙන් පරාජිතව සිතීම නිසා දිවිනසා ගැනීමට පෙළඹිය හැකිය. ඇතැම් විශාද රෝගීන් තුළ ගොඩනැගෙන මායාත්මක විශ්වාසය වන්නේ සියදිවි නසා ගැනීම අදාළ ගැටලුවට ඇති එකම විසඳුම ලෙස දකී. මෙහිදී රෝගී මායාව විසින් පුද්ගලයා සම්පූර්ණයෙන්ම යථාර්තයෙන් ඈත් කරනු ලැබේ. එම නිසා මෙවැනි විශාද රෝගීන් සිතනු ලබන්නේ දිවි නසා ගැනීම සාපරාධී හෝ සමාජ

අසම්මත හෝ ක්‍රියාවකට වඩා ඇතැමෙකුට මෙවැනි විටක වීර ක්‍රියාවක් ලෙස පෙනෙන්නේද මෙම රෝගී මායාව නිසාය (පෙරේරා, 2002, 41 පිටුව).

සිය දිවි නසා ගැනීම පිළිබඳ ප්‍රවෘත්ති දර්ශනය කිරීම, ශ්‍රවණය කිරීම නිසා කෙනෙකු සිය ජීවිතය නැති කර ගැනීමට පෙළඹෙන බව ඩී.පී. පිලිප්ස් විසින් සිය පර්යේෂණ මඟින් පෙන්වා දී තිබේ. ඔහු දක්වන්නේ තමන් ගේ හා සමාන ප්‍රශ්නයකට මැදි වූ කෙනෙකු එය විසඳීමේ පියවරක් ලෙස ජීවිතය නැතිකර ගන්නා බව දකින විට සිය ගැටලුවට ඇති විසඳුම මරණය පමණක්ම බව ඔහු හෝ ඇය විසින් ප්‍රත්‍යක්ෂ කර ගන්නා බවයි. විශේෂයෙන්ම පුවත්පත් මඟින් සිය දිවි නසා ගැනීමට ප්‍රබල රුකුලක් සපයයි. සියදිවි නසාගැනීම පිළිබඳ දීර්ඝ විස්තර, ඒ සම්බන්ධ ඡායාරූප, දිවිනසාගත් පුද්ගලයා ගේ අවසන් ප්‍රකාශය සහිතව ආකර්ශණීයව ඉදිරිපත් කිරීම සිය දිවි නසා ගැනීම සඳහා අනුබල සපයයි. සිය ප්‍රේම සබඳතාවයට දෙමාපියන් විරුද්ධ වීම නිසා තරුණ යුවලක් දිවි නසා ගැනීමේ පුවතක් මඟින් දෙමාපියන්ගෙන් සියුම්ව පලි ගැනීමක් කළ බව වාර්තාවේ අන්තර්ගත වේ. එවැනි ප්‍රවෘත්ති ඇසගැටෙන විට එවන් තත්වයකට මුහුණ පා සිටින පිරිසකට එම සිදුවීම පෙළඹවීමක් ඇති කරයි.

තවද සිය දිවි නසා ගැනීම සඳහා එක් එක් පුද්ගලයන් භාවිත කරන ලද ක්‍රමයන් ජනමාධ්‍ය මඟින් පෙන්වයි. පළිබෝධනාශක පානය, කණේරු ඇට කෑම, වැනි ක්‍රම ජනමාධ්‍ය ඔස්සේ ප්‍රචලිත වූ ක්‍රමයන් වේ. උදාහරණ ලෙස දෙමළ චිත්‍රපටයක් මඟින් කණේරු ඇට කෑම පෙන්වූ පසු එය ප්‍රචලිත විය. සිය දිවි නසාගැනීම සම්බන්ධ ප්‍රවෘත්ති පලවූ මාසයට පසු මාසය තුළ සිය දිවි නසා ගැනීම ඉහළ ගිය බව ඩී. පී. පිලිප්ස් විසින් කරන ලද සමීක්ෂණයකින් හෙලිවිය. තවද මාධ්‍ය මඟින් සමාජයට ගෙන එන යම් යම් ප්‍රතිරූපයන් සැමරීම සඳහා ද තවත් පිරිසක් සියදිවි හානිකර ගනිති. මෙම ප්‍රතිරූප අතර සිනමා නළුවන්, ගායකයන්, දේශපාලඥයන් සිටින අතර ඔවුන් ගේ මිය ගිය දින වාර්ෂිකව සිහි කිරීම ඔස්සේ මෙම දිවි නසා ගැනීමට පෙළඹී සිටිති. ඩයනා කුමරිය මියගිය දිනය සිහි කරමින් අයෙක් දිවි නසාගත් බව විදේශීය රටකින් වාර්තා විණි. තවද මාධ්‍ය මඟින් වාර්තා යම් විශේෂිත පුද්ගලයෙකු ගේ දිවිනසා ගැනීමේ පවතින විශේෂභාවය තවත් පුද්ගලයකු තම ජීවිතය නැති කර ගැනීමට ආරෝපණය කරගන්නා බව කේ ඉෂි විසින් පවසයි.

සෞඛ්‍යමය සාධක ඔස්සේ භින්නෝන්මාදය, විෂාදය වැනි මානසික රෝග, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම, පෞරුෂයේ විෂමතා, අධික ලෙස කේන්ති යාම, අනවශ්‍ය කලබලකාරී බව, අශුභවාදී සිතුවිලිවල ගැලී සිටීම, කලකිරීම, අසරණවීම, මානසික අවපීඩනය, විශාදය වැනි රෝග තත්වද සිය දිවි නසා ගැනීමට හේතු වේ. ප්‍රේම සම්බන්ධතා බිඳී යාම, දෙමාපියන් ගේ දෝෂාරෝපණ, ගුරුවරුන් ගේ දෝෂාරෝපණ, තමන් ආදරය කළ අයගේ වෙන් වීම නිසා මානසික ආතති තත්වයන් ඇති වේ. මේ නිසා ද සිය දිවි නසා ගැනීමේ තත්වයන් ඇති වේ. ජනමාධ්‍ය මඟින් සමාජය තුළ අවශ්‍යතා, හැඟීම් උද්දීපනය කරයි. ඒවා පරිපූර්ණ කර ගැනීමට නොහැකි වූ කල්හි ඉහත කියන ලද විෂාදය හා මානසික ආතති

තත්වයන් ඇති කරයි. නූතන සමාජය සන්දර්භය තුළ ගොඩ නැගී ඇති අවිධිමත් චර්යාවන් කෙරේ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යවල බලපෑම අතිශයින් වැදගත් වේ.

**ජනමාධ්‍යය මානසික රෝග කෙරෙහි බලපාන ආකාරය**

මායා සහ භ්‍රාන්ති ( Delusions and Hallucinations ) නමින් හැඳින්වෙන මානසික රෝගී තත්වයක් පවතින බව මුලින් සඳහන් කළේය. මෙහිදී බාහිර ලෝකයේ පවත්නා දේවල් වෙනස් වශයෙන් දකියි. බොහෝ දුරට මිත්‍යා විශ්වාසයන් සමඟ මායා සහ භ්‍රාන්ති රෝගී තත්වය බැඳී තිබේ. මායාව යන්නෙහි සරල අර්ථය වන්නේ මුලාව යන්නයි. ඒ අනුව යථාර්ථයෙන් ඈත් වූ පුද්ගලයා බොහෝ දේවල් සම්බන්ධයෙන් මුලා වූ තත්වයට පත් වේ. මෙවැනි අවස්ථාවකදී භින්නෝන්මාද රෝගියෙකු ඇතැම් විට සදාචාර විරෝධී හෝ සාපරාධී දෙයක් යහපත් දෙයක් යන වැරදි වැටහීමෙන් ක්‍රියාවට නැඟිය හැකි වේ. මායා සහ භ්‍රාන්ති රෝග තත්වය මිත්‍යා විශ්වාසයන් සමඟ බැඳී තිබේ. මායා සහ භ්‍රාන්ති රෝග තත්වය ඇති වීමට ජනමාධ්‍යය බලපාන බව පැහැදිලිවම දැකගත හැකිය. උදාහරණයක් වශයෙන් එය මෙසේ දැක්විය හැකිය. මිත්‍යා විශ්වාසයන් ඇතුළත් දර්ශන චිත්‍රපටවලට සහ ටෙලි නාට්‍යවලට බොහෝ විට යොදා ගනියි. එවැනි මිත්‍යා දර්ශන හේතුකොට ගෙන එයාකාරයේ සත්‍ය ලෝකයක් පිළිබඳ විශ්වාසයක් ප්‍රේක්ෂකයා තුළ ඇති වීම නිසා මානසික රෝගී තත්වයක් ඇති වීමට බලපෑ හැකිය.

ඉහත දක්වන ලද ආකාරයට මිත්‍යා විශ්වාසයන් දැකගත හැකි චිත්‍රපටයක් ලෙස 'ඩ්‍රැකියුලා' චිත්‍රපට හැඳින්විය හැකිය. ඩ්‍රැකියුලා චිත්‍රපට තුළ කිසියම් පුද්ගලයෙකුගේ ගෙලෙන් ලේ උරා බොන දර්ශන, ලේ තිබෙන ස්ථානයකට ඩ්‍රැකියුලා ආකර්ශනය වීම, මිනී පෙට්ටි තුළ ඩ්‍රැකියුලා නිදා ගැනීම, කුරුසය සහ සුදු ලූණු මල් ඩ්‍රැකියුලා පලවා හැරීමට යොදා ගැනීම ආදි මිත්‍යා දර්ශන තිබේ. චිත්‍රපටය තුළින් ඩ්‍රැකියුලා දකින ප්‍රේක්ෂකයින් එවැනි සත්වයෙකු සැබෑ ලොවේ සිටිතැයි විශ්වාස කිරීමට පටන් ගනියි. ඒ තුළින් සැබෑවටම එම සත්වයාගෙන් තමන්ට බලපෑමක් සිදුවේ යැයි බියක් හටගනියි. ඒ පිළිබඳව දිගින් දිගටම සිතීමෙන් මානසික රෝග තත්වයකට වර්ධනය වීමට හැකියාව ඇත. එවැනි මිත්‍යා විශ්වාසයන් ඇතුළත් වන තවත් උදාහරණ ලෙස Lord of the Ring, Harry Potter, Incredible Hulk,Merlin, භවත්‍රා දැක්විය හැකිය.

තවද මායා සහ භ්‍රාන්ති රෝගී තත්වයක් ඇති වූ රෝගියෙකු තුළ සදාචාර විරෝධී දෙයක් හෝ සාපරාධී දෙයක් යහපත් දෙයක් යන වැරදි වැටහීමෙන් ක්‍රියාවට නැඟිය හැකි වේ. මෙවැනි තත්වයන් ද ජනමාධ්‍යය තුළින් ඇති කෙරේ. විශේෂයෙන්ම දෙමළ සහ හින්දි චිත්‍රපටවල චිත්‍රපටයේ වීරයා අසාධාරණයන්ට එරෙහිව නීතිය අතට ගෙන සටන් කරන අවස්ථාවන් දැකිය හැකිය. මෙවැනි දෙයක් සැබෑ ලෝකයේදී බලාපොරොත්තු විය නොහැක. නමුත් සමහර ප්‍රේක්ෂකයන් මෙවැනි අවස්ථාවන් සදාචාර විරෝධී වුවත් යහපත් දෙයක් යන වැරදි වැටහීමෙන් ක්‍රියාවට නැඟිය හැකිය. එවැනි අවස්ථාවන් මානසික රෝගී තත්වයන්ට මූලික විය හැකිය. රෝගී මායාවන් හා සාමාන්‍ය විශ්වාසය ජනමාධ්‍යය මඟින් ප්‍රේක්ෂකයාට බලපෑමක් කළ හැකිය. එයට ජනමාධ්‍යය තුළින් උදාහරණ

ඉදිරිපත් කළ හැකිය.' ටාසන් ' චිත්‍රපටය හෝ කථා මාලාව නරඹනු අයෙක් තමා ටාසන් යැයි සිතා කටයුතු කිරීම මානසික රෝගි තත්වයකි. එහිදි ටාසන්ගේ චර්යාවන් අනුගමනය කිරීමෙන් විවිධ ක්‍රියාකාරකම්හි නිරත වෙයි. තවත් උදාහරණයන් දැක්වුවහොත් සමහරුන් තමා විජය කුමාරතුංග හෝ ෂාරුක් ඛාන් ලෙස සිතා කටයුතු කිරීම දැක්විය හැකිය.

භින්නෝන්මාදයේ තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ භ්‍රාන්ති දැකීමයි. භ්‍රාන්තිය යනු ලෝකයේ නොපවත්නා දෙයක් දැකීමයි. මෙම භ්‍රාන්තිය ශ්‍රව්‍ය දෘශ්‍ය වශයෙන් බෙදිය හැකිය. දෙවිවරුන්, භූතයන්, මිය ගිය අය පෙනීම දෘශ්‍යමය භ්‍රාන්ති වේ. මේ අය කථා කරන ශබ්ද හෝ වෙනත් අමුතුම ශබ්ද හෝ ඇසීම ශ්‍රව්‍ය භ්‍රාන්ති ලෙස හැඳින්විය හැකිය. රෝගී මායාව තුළද මෙලෙස දෘශ්‍ය හා ශ්‍රව්‍ය වශයෙන් අංශ දෙකක් දක්නට ලැබේ. ඉහත දක්වන ලද රෝග තත්වයන් ඇති වීමට ජනමාධ්‍යය බලපෑ හැකිය. උදාහරණයක් වශයෙන් RAAZ චිත්‍රපටය හැඳින්විය හැකිය. එහි භූතයන් හා මිය ගිය අය පෙනීම, අමුතුම ශබ්ද ඇසීම වැනි දර්ශන ඇතුළත් වේ. එම දර්ශන දකින ප්‍රේක්ෂකයා තුළ බියක් ඇති විය හැකිය. ඒ භූතයන් සැබෑ ලෙසම සත්‍ය ලෝකයේ සිටියි, මිය ගිය අය නැවත පැමිණ හොල්මන් කළ හැකිය, තමන්ට ඒ අයගෙන් හිරිහැරයක් වේ යැයි සිතීමෙනි. මේ තත්වය යටතේ තම නිවසේ යමෙක් මිය ගිය හොත් එම පුද්ගලයා යළි පැමිණෙතැයි බියක් ඇති වේ. එහිදි කාමරයකින් කාමරයකට යාමට බිය විය හැකිය. මෙම බිය වීම දීර්ඝ කාලයක් තිස්සේ වර්ධනය වීමෙන් මානසික රෝගි තත්වයක් ඇති විය හැකිය. එමෙන්ම සාම්ප්‍රදායික භූතයන් පිළිබඳ තිබෙන බිය ජනමාධ්‍යය තුළින් තවත් වර්ධනය කරයි.

පැරනොයිඩ් භින්න උන්මාදය තුළ රෝගී මායාව දක්නට ලැබේ. තද සැකය මෙහිදි මූලික ලක්ෂණයක් වන අතර එය තම ආහාරවලට වස විෂ දමා ඇති බවට සිතීම, තමාට හදි හූනියම් කර ඇති බව හා තමා ගැන අනන්‍යයන් විපරම් කරන බවට සිතීමට රෝගියාව පොළඹවයි. මෙම රෝගී තත්වය ඇති වීමට ජනමාධ්‍යය බලපෑම් කළ හැකි බව පැහැදිලි වේ. හදි හූනියම්, ආහාරවලට වස විෂ දැමීම, අනන්‍යයන් තමා ගැන විපරම් කරන අවස්ථා වැනි දර්ශන ජනමාධ්‍යය මඟින් පෙන්වනු ලැබේ.මෙවැනි අවස්ථා දිගින් දිගටම දැකීමෙන් ඒ පිළිබඳව සිතීමෙන් මානසික රෝගී තත්වයට පත්විය හැකිය. එවැනි දර්ශන ඇතුළත් ටෙලි නාට්‍යය ලෙස අග්නි සංසාරිය, පිංකද සිමෝනා, ඉන්දියානු ටෙලිනාට්‍ය ආදිය දක්විය හැකිය.

කෙසේ වුව ද ඉහත සඳහන් සැකයන් හා මායාත්මක තත්වයන් භින්නෝන්මාද රෝගීන් තුළ පමණක් නොව සාමාන්‍ය මිනිසුන් තුළ ද ඇති වේ. එමෙන්ම වර්තමානයේ විකාශය වන ටෙලි නාට්‍යය දෙස බැලුවහොත් බොහෝ විට ඒවායේ පවතින්නේ අනියම් විවාහ සම්බන්ධතා පිළිබඳවය. එම ටෙලි නාට්‍යය දෙස බලන රසිකයා ඒවා වැළඳ ගනු ලැබේ. එහිදි තමාත් ඒ කෙරෙහි යොමු වීමට හෝ තම බිරිඳ හෝ සැමියා දෙස සැකයෙන් බැලීමට පෙළඹේ. එහිදි අවසානයේ පැරනොයිඩ් භින්න උන්මාදය ඇති වීමට පුළුවන. ලංකාවේ මෑත භාගයේ දක්නට ලැබුණු භීෂණය හා සම්බන්ධ අතුරුදහන් වීම්, පැහැර ගෙන යාම්, මිනිස් ඝාතන

ආදිය හේතු කොට ගෙන තරුණ සමාජය තුළත්, දෙමාපියන් තුළත් ක්ලමථය, හීතිකාව, කාංසාව පදනම් කරගත් නියුරෝසික විශාද ප්‍රතික්‍රියා යටතේ පුද්ගලයා රෝගී තත්ත්වයට පත්විය. තවද උතුරු නැගෙනහිර මායිම් ගම්මාන ආශ්‍රිතව ජීවත් වන පුද්ගලයන් තුළ ද මෙම නියුරෝසික විශාදය දක්නට ලැබේ. මේ අය තුළ සයිකෝසික විශාදය තරම් දරුණු සියදිවි නසා ගැනීමේ ලක්ෂණ දක්නට නොලැබුණ ද කලකිරුණු ස්වභාවයෙන් යුක්තව ඔවුන් ජීවිතයට මුහුණ දීමට පුරුදු වී සිටිති. ජනමාධ්‍යය තුළින් යුද්ධයේ භයංකර බව, සියදිවි නසා ගැනීම්, අතුරුදහන් වීම්, භීෂණය, මිනිස් ඝාතන ආදිය චිත්‍රපට, ටෙලි නාට්‍යය සහ ප්‍රවෘත්ති තුළින් පුන පුනා දැක්වීම හරහා මිනිසාගේ මානසික බිඳ වැටීමට පොළඹවනු ලබයි. එහිදී පැහැදිලිවම පෙනෙන්නේ බාහිර හේතූන් නිසා ඇති වන නියුරෝසික විශාද ප්‍රතික්‍රියාවලට වඩාත් ශාරීරික හේතූන් අනුව සිදුවන සයිකෝසික ප්‍රතික්‍රියා තුළ ජනමාධ්‍යය පුද්ගලයාට හා සමාජයට අහිතකර ලක්ෂණ ඇති කරන බවයි. ඉහත දක්වන ලද ඒවාට උදාහරණ ලෙස X – File, Murder, ප්‍රඩේටර් ඉංග්‍රීසි චිත්‍රපටය, ඇඟිලි සලකුණ, ලංකාවේ යුධ වාර්තාකරණය දැක්විය හැකිය.

විශාද රෝගය සුළු රෝග පද්ධතියට අයත් නියුරෝසික රෝගයක් වශයෙන් ඉදිරිපත් වන අවස්ථා තිබේ. මෙම විශාද තත්වය බාහිර හේතූන් නිසා ඇති වන එකක් ලෙස දැක්විය හැකිය. එවැනි රෝගීන් තුළ දක්නට ලැබෙන මූලික ලක්ෂණය වන්නේ දැඩි කලකිරීමයි. මෙම කලකිරීම ඇති වන්නේ විවිධ බාහිර හේතූන් නිසාය. එම බාහිර හේතූන් අතර ජනමාධ්‍යය ප්‍රමුඛ ස්ථානයක් ගනියි. ඇතැම් විට සුළු දෙයින් පවා කම්පාවට පත්වන තත්වයක් සහිත පෞරුෂයකින් හෙබි පුද්ගලයන් තුළ මෙම තත්වය ඇති විය හැක. අප ආශා කරන දෙයක් අහිමි වීම, පවුලේ සාමාජිකයෙකුගේ හිතවතෙකුගේ මරණයක්, ප්‍රේම සම්බන්ධතා බිඳ වැටීම, විශාල මුදල් පාඩු, සොර සතුරු පීඩා, රැකියා අහිමි වීම, මාරු කිරීම්, විභාග අසමත් වීම්, දික්කසාදය, අධික ණය බර, ස්ත්‍රී දූෂණය ආදී බාහිර හේතු මේ සඳහා මුල් වේ. උක්ත ශීර්ෂයන් ජනමාධ්‍යය වැඩසටහන් හෝ නිර්මාණයන් අතර වස්තු බීජය වේ. එම හේතුව නිසා ජනමාධ්‍යය වටා රැස්ව සිටින පුද්ගලයන් අදාල කාරණය තම පෞද්ගලිකත්වයට ඈදා ගනියි. එහි ප්‍රතිඵලය වන්නේ විශාදය වීමට පුළුවනි. ඒ සඳහා උදාහරණ ලෙස යෙහෙළි, ආගන්තුකයා චිත්‍රපටය, සිනාසෙන්න අනුත්තරා ටෙලි නාට්‍යය, ගොළු හදවත ආදිය දැක්විය හැකිය. අප මාධ්‍යය තුළින් දකින නළු නිළියන්, නිවේදක නිවේදිකාවන් ආදී පුද්ගලයන්ගේ ජීවිත චරිත ස්වභාවයන් අප රූපවාහිනිය ආදී මාධ්‍යය තුළින් දකින ආකාරයටම පිළිගැනීමට අප හුරු වී සිටියි. මෙහිදී සමහර රටවල ප්‍රවෘත්ති වැඩසටහන් එක දිගට ඉදිරිපත් කළනිවේදකයා නොමැති වූ අවස්ථාවලදී ප්‍රේක්ෂකයන් ප්‍රවෘත්ති වැඩසටහන නැරඹීම අත්හැර දැමූ අවස්ථා ද ඇත.

කෙසේ වෙතත් මෙම අධි සාමාජීය තත්වය තදින්ම මානසිකව බලපානු ලබන්නේ අප එම පුද්ගලයන්ගේ ජීවන රටාව අප ජීවිත තුළට ආදේශ කර ගැනීමෙන්ය. අප පරමාදර්ශී චරිතයක් ලෙස සිතාගෙන සිටින පුද්ගලයෙකුගේ චරිතය සමහර විටෙක තම පෙම්වතා සමඟ සසඳා බලා තම පෙම්වතා එසේ නොවූ විට